
# සුව විරුවන් වෙනුවෙන් කැපවූ සමාජ සත්කාරය

## ජාතික බෝවන රෝග විද්‍යායතනයේ
## නව හෙද නේවාසිකාගාරය



RCOBECF






**හෙද නේවාසිකාගාරය**

**අංගොඩ ජාතික විද්‍යායතන (NIID) රෝහල**

| | |
|---|---|
| ව්‍යාපෘතිය ආරම්භක දිනය | : 2020.04.13 |
| ව්‍යාපෘතිය නිම කළ දිනය | : 2020.04.30 |
| ව්‍යාපෘති කාලය | : දින 17 |
| කාමර සංඛ්‍යාව | : 16 |





කොවිඩ් 19 දරුණු ගෝලීය වසංගතය අප මාතෘ භූමිය ද ආක්‍රමණය කරන මොහොතේ එයට මුහුණ දීම සඳහා පිහිටවනු ලැබූ කොවිඩ් 19 වසංගත පාලන කාර්ය සාධන බලකාය අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන් විසින් පිහිටවනු ලැබී ය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති, හිටපු යුධ හමුදාපති ජෙනරාල් දයා රත්නායක මහතා ද මෙම බලකායේ සාමාජිකයෙකි. එහි පැවති රැස්වීමක දී අංගොඩ ජාතික බෝවන රෝග විද්‍යායතනය ට ඉතාමත් කඩිනමින් ඉටු විය යුතු අවශ්‍යතාවයක් ලෙස හෙද නේවාසිකාගාරයක අවශ්‍යතාවය මතු වි ය.

එහි දී **ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරාල් දයා රත්නායක මහතා**ගේ පූර්ණ මැදිහත් වීමෙන් මෙම සත්කාරය සඳහා දායක වීමට ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි කොළඹ රාජකීය විද්‍යාලයීය ආදි ශිෂ්‍යයින්ගේ **East Coast** පදනම ඉදිරිපත් වි ය.

මේ සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු එම පදනමේ **ලේකම් සේනක සෙනවිරත්න මහතා** විසින් සිදු කරන ලදුව, මෙම ව්‍යාපෘතියට අවශ්‍ය මූල්‍ය අනුග්‍රහය ලබා දීමට එම පදනමේ **සභාපති වෛද්‍ය සුකුමාර් නාගේන්ද්‍රන් මහතා** කාරුණිකව ඉදිරිපත් විය.

මේ සඳහා ඒ මහතා විසින් රුපියල් මිලියන 15 ක පූර්ණ මූල්‍ය ප්‍රදානයනයක් සිදු කරන ලදී.





ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ මග පෙන්වීම මත ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි - අධ්‍යක්ෂ (තාක්ෂණ) ඉංජිනේරු සුසන්ත අබේසිරිවර්ධන මහතා ඇතුළු කණ්ඩායමේ පූර්ණ තාක්ෂණික දායකත්වයෙන් ද,

ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) සමන් දේවප්‍රිය මහතා ඇතුළු වඩු කර්මාන්ත ශාලාවේ කාර්මික මහතුන්ගේ දායකත්වයෙන් ද මෙම නේවාසිකාගාරය ඉදි කිරීම සඳහා දායකත්වය සපයනු ලැබී ය.



ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුමංගල ඩයස් මහතාගේ  නියෝගය පරිදි, එයාර් වයිස් මාර්ෂල් රුචිර සමරසිංහ සහ වින්ග් කමාන්ඩර් ක්‍රිශාන්ත හේවාපති-රණ හා වීරෝධාර ගුවන් විරුවන්ගේ ශ්‍රමදායකත්වය ද මෙම නේවාසිකාගාරය ඉදි කිරීම සඳහා මහත් පිටිවහලක් වි ය
















ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අධීක්ෂණය යටතේ LHP Eco පුද්ගලික සමාගම් විසින් මෙම නේවාසිකාගාරයේ ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදී.

# NEW YORK ROYALISTS DONATE RS. 15 MILLION FACILITY TO IDH HOSPITAL, ANGODA

*I*n response to an urgent request by the Presidential Task Force for Covid 19 control, the Royal College OldBoys' East Coast Foundation (RCOBECF) based in New York donated Rs. 15 Million for the construction and furnishing of a 16 room/32 bed nurses quarters at the Infectious Diseases Hospital (IDH) at Angoda. The need for this facility was triggered by the overwhelming demand for nursing care required to treat the large number of Covid patients brought to the hospital from throughout the country. With accommodation limited to 30 nurses at the existing facility, the hospital faced great difficulty in sustaining the essential work force. This was further complicated by the potential transfer of the virus by these workers to their families;
hence the urgent need to expand their accommodation at the hospital.
Due to the urgency of the project, a project team was established by the Sri Lanka Ports Authority (SLPA), led by its Chairman Rtd. General Daya Ratnayake. To fast-track the construction (less than 3 weeks), the building was designed to be pre-fabricated. While the SLPA was responsible for design, contract management and supervision, construction services were provided by the Sri Lanka Air Force (SLAF). The entire project targeted for opening on May 8, 2020 (Vesak Day) will consist of 16 fully furnished bedrooms to accommodate 32 beds and adequate restroom facilities.

In a statement released by the President of RCOBECF, Dr. Suku Nagendran said that *"it is our privilege on this holy day*

*of Vesak, to donate this much-needed fully furnished facility to the IDH. While we "New York Royalists" have left Sri Lanka for higher education and career advancement, our hearts are still with the motherland. We attribute our success abroad to our years of rigorous and free education in Sri Lanka, where we were taught the value of integrity, teamwork, tenacity, and unconditional service for the betterment of humanity. Since the formation of our Alumni Association in 1993, more than 27 years ago, we have been involved in charitable activities in both Sri Lanka and the United States, all with the goal of improving lives of those less fortunate. Covid 19 has pushed the global healthcare system to its limits. Sri Lanka's rapid and thorough response has led to an impressive containment effort. The service of the doctors and nurses at IDH plays an important role within this multifaceted effort. Hence, the request to build this wing to house hospital staff was considered a critical need by our Alumni Foundation.*

*We are happy to have worked with the dedicated team from the Sri Lanka Air Force, and the Ports Authority, who worked tirelessly day and night to make this a reality today. The encouragement and support of the Principal Royal College and the Royal College Union (RCU) are also acknowledged. Finally, to the doctors, nurses and healthcare workers of IDH, you are true heroes, and we salute you for putting your lives on the line to treat the vulnerable without any expectations! It is said that those who follow this principle are the happiest people, as is truly evident today. Although separated by oceans and continents, we are always here to help Sri Lanka and its people achieve greatness and become a safe and just society for all."*

May 8, 2020

**Senaka Senaviratne**
Past President and Secretary
RCOBEC Foundation USA

www.RCOBECF.org

අංගොඩ බෝවන රෝග විද්‍යායතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ආනන්ද විජේවික්‍රම සහ අධ්‍යක්ෂ වෛද්‍ය හසිත අත්තනායක මහත්වරුන් ඇතුළු නිළධාරීන් මෙම නේවාසිකාගාරය ඉදිකිරීමේ දී අඛණ්ඩ ව සිය දායකත්වය සපයන ලදී.







ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි කොළඹ රාජකීය විද්‍යාලයීය ආදි ශිෂ්‍යයින්ගේ **East Coast** පදනමේ සභාපති වෛද්‍ය සුකුමාර් නාගේන්ද්‍රන් මහතාගේ මූල්‍ය දායකත්වයෙන් මෙයට පෙර අවස්ථා ගණනාවක දී ම මෙවැනි සමාජ සත්කාරයන් ගණනාවක් ම සිදු කර ඇත.







"

මීට වසර 27 කට පෙර 1993 දී අපගේ ආදි ශිෂ්‍ය සංගමය පිහිටුවීමෙන් පසු, ශ්‍රී ලංකාවේ සහ ඇමරිකා එක්සත් ජනපදයේ පුණ්‍ය කටයුතුවල නියැලී සිටිමු. IDH හි වෛද්‍යවරුන්ගේ සහ හෙදියන්ගේ සේවය මෙම බහුවිධ උත්සාහය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සභාපති ජෙනරාල් දයා රත්නායක මහතාගේ පූර්ණ මැදිහත්වීම මත මෙම සත්කාරය සඳහා දායකත්වය ලබා දීමට අපට අවස්ථාව ලැබුණි.

ශ්‍රී ලංකාව කොවිඩ් 19 වසංගතයට මුහුණ දෙන මෙම අවස්ථාවේ අංගොඩ බෝවන රෝග විද්‍යයතනයට අවශ්‍යතාවයක් ව පැවැති හෙද නේවාසිකාගාරය ඉදි කිරීමේ සත්කාරයට දායකත්වය ලබා දීමට හැකියාව ලැබීම අප හට ලැබුණු ඉමහත් භාග්‍යයක් ලෙස සලකමු. සාගර හා මහාද්වීප වලින් වෙන්ව සිටියද, අපි සැමවිටම කටයුතු කරන්නේ ශ්‍රී ලංකාවට සහ එහි ජනතාවට සුරක්ෂිත හා සාධාරණ සමාජයක් සහතික කිරීම වෙනුවෙනි. මෙම වෙසක් පොහෝ දිනයේ මෙම සත්කාරය නිමවා හෙද නේවාසිකාගාරය අංගෙ ාඩ බෝවන රෝග විද්‍යායතනය වෙත ප්‍රදානය කිරීමට ලැබීම මෙම පුණ්‍ය කටයුත්තේ වටිනාකම තවත් තීව්‍ර කරයි.

**- වෛද්‍ය සුකුමාර් නාගේන්ද්‍රන් -**

# සුව විරුවන් වෙනුවෙන් කැප වූ සමාජ සත්කාරයේ පිය සටහන්

















කොවිඩ්-19  දරුණු ගෝලීය වසංගතය
අප මාතෘ භූමිය ද ආක්‍රමණය කරන විට
සිය සියළු බල මුළු පවුරු බැඳ
මුළු මහත් ජාතියටම ආරක්ෂාව සපයනු වස්
**අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිඳුන්** විසින්
පිහිටවනු ලැබූ

**"කොවිඩ්-19 වසංගත පාලන කාර්ය සාධන බලකාය"**
අංගොඩ - ජාතික බෝවන රෝග විද්‍යායතනයට (NIID-රෝහල)
හෙද නේවාසිකාගාරයක් ඉදිකිරීමට සාකච්ඡා කරන ලදුව
එම බලකායේ සාමාජික - හිටපු යුද හමුදාපති,
ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති,
**ජෙනරාල් දයා රත්නායක** මැතිතුමන්ගේ
පූර්ණ මැදිහත් වීමෙන්,

ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි කොළඹ රාජකීය විද්‍යාලයීය
ආදි ශිෂ්‍යයින්ගේ East Coast පදනමේ ලේකම්
**සේනක සෙනවිරත්න** මහතාගේ සම්බන්ධීකරණයෙන්,
එම පදනමේ සභාපති වෛද්‍ය **සුකුමාර් නාගේන්ද්‍රන්** මහතාගේ
රුපියල් මිලියන 15 ක පූර්ණ මූල්‍ය ප්‍රදානයෙන් ද,

ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි - අධ්‍යක්ෂ (තාක්ෂණ)
ඉංජිනේරු **සුසන්ත අබේසිරිවර්ධන** මහතා
ඇතුළු කණ්ඩායමේ පූර්ණ තාක්ෂණික දායකත්වයෙන් ද,
LHP Eco පුද්ගලික සමාගම් විසින් ඉදිකිරීම් සිදු කරන ලද,

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් හමුදාපති
එයාර් මාර්ෂල් **සුමංගල ඩයස්** මහතාගේ  නියෝගය පරිදි,
එයාර් වයිස් මාර්ෂල් **රුචිර සමරසිංහ** සහ
වින්ග් කමාන්ඩර් **ක්‍රිශාන්ත හේවාපතිරණ** හා
වීරෝධාර ගුවන් විරුවන්ගේ ශ්‍රමදායකත්වයෙන් ද,

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ප්‍රධාන ඉංජිනේරු (සිවිල්)
**සමන් දේවප්‍රිය** මහතා ඇතුළු
වඩු කර්මාන්ත ශාලාවේ කාර්මික මහතුන්ගේ දායකත්වයෙන්ද යුතුව,
සුව විරුවන් තිස් දෙදෙනකු සඳහා නේවාසික පහසුකම් ලබාදිය හැකි පරිදි
කාමර 16 කින් ඉදිකිරීම නිම කළ

**"හෙද නේවාසිකාගාරය"**

අංගොඩ - ජාතික බෝවන රෝග විද්‍යායතනය හී
ජ්‍යේෂ්ඨ උපදේශක **ආනන්ද විජේවික්‍රම** මහතා,
අධ්‍යක්ෂක - **වෛද්‍ය හසිත අත්තනායක** මහතා හා
ප්‍රධාන හෙද නිලධාරිනී - **ගීතානි චම්පිකා උඩුගම්කෝරාළ** මහත්මිය
ඇතුළු කාර්ය මණ්ඩලය වෙත
**වර්ෂ 2020 ක් වූ මැයි මස 08 වන දින**
භාර දුන් වගයි.

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සභාපති
**ජෙනරාල් දයා රත්නායක** මැතිතුමන්ගේ
පූර්ණ මැදිහත් වීමෙන්,
ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටි
කොළඹ රාජකීය විද්‍යාලයීය
ආදි ශිෂ්‍යයින්ගේ East Coast පදනමේ සභාපති
වෛද්‍ය සුකුමාර් රාජේන්ද්‍රන් මැතිතුමන්
සහ ඈන් රාජේන්ද්‍රන් මැතිණියගේ
රුපියල් මිලියන 15 ක පූර්ණ මූල්‍ය ප්‍රදානයෙන්,

ශ්‍රී ලංකා වරාය අධිකාරියෙහි
මෙහෙයුම් දායකත්වයෙන් යුතුව
අභිනවයෙන් ඉදිකළ අංගොඩ
ජාතික බෝවන රෝග විද්‍යායතනය හී (NIID-රෝහල)

**"හෙද නේවාසිකාගාරය"**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා
ගරු අමාත්‍ය **පවිත්‍රා වන්නිආරච්චි** මැතිණිය විසින්
**වර්ෂ 2020 වූ මැයි මස 8 වන දින**

අංගොඩ-ජාතික බෝවන රෝග විද්‍යයතන
(NIID) රෝහලට භාර දුන් වගයි




සැකසුම

සන්නිවේදන හා මහජන සම්බන්ධතා කොට්ඨාශය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය

වෙබ් අඩවි **slpa.lk** සහ **news.slpa.lk**